චක්‍රලේඛ අංක: 03/2019

RG/MBD/I/චක්‍රලේඛ

2019.02. 20

සියලුම කලාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,
සියලුම දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්

**1951 අංක 17 දරණ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (49) වන වගන්තියේ ප්‍රතිපාදන අදාළ කරගත හැකි අවස්ථා**

උක්ත කරුණ සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද උපදෙස් හා බැඳේ.

පුද්ගලයින් විසින් සැලකිය යුතු කාලයක් භාවිත කර ඇතැයි නිරීක්ෂණය වන සහ එම අය භාරයේ තිබෙන උප්පැන්න සහතික, දෙපාර්තමේන්තු ලේඛනවලට ඇතුලත් නොවී ඇති අවස්ථා පිළිබඳ විවිධ මහජන පැමිණිලි/ ඉල්ලීම් වාර්තා වේ. විවිධ මානුෂීය, සමාජීය හෝ පෞද්ගලික හේතු මත පුද්ගලයින් විසින් දැනුවත්වම ව්‍යාජ සහතික භාවිත කර ඇති අවස්ථා ද නිරීක්ෂණය විය. තවද විශේෂයෙන් පාසල් ශිෂ්‍යයින් ජාතික හැඳුනුම්පත සකස් කර ගැනීමට යෑමේදී තමන් මෙතෙක් කල් භාවිත කර ඇති උප්පැන්නය නිසි පරිදි ලියාපදිංචි කරන ලද උප්පැන්නයක් නොවන බවට කරුණු අනාවරණය වන අවස්ථා ද වාර්තා විය.

උපතක් නිසි පරිදි ලියාපදිංචි නොවී ඇති අවස්ථාවකදී 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (24) වන වගන්තිය ප්‍රකාරව කටයුතු කර කල්ගත වූ උපතක් ලෙස උපත ලියාපදිංචි කර ගැනීමට ප්‍රතිපාදන ඇත. නමුත් දෙමාපියන් දෙදෙනාම හෝ එක් අයෙක් හෝ ජීවතුන් අතර සිටින නමුත් විවිධ හේතුන් මත දරුවාගේ උපන් දිනය, ස්ථානය සහ දෙමාපියන්ගේ තොරතුරු ලිඛිතව සනාථ කිරීමට අපොහොසත් වන අවස්ථාවකදී පනතේ (24) වන වගන්තිය යටතේ කටයුතු කරමින් උප්පැන්න සහතිකයක් නිකුත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්ට කටයුතු කළ නොහැක.
උදා :-

- නිවසේ දී ඉපදුණු දරුවන් සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි/ වින්නඹු මාතා නිකුත් කළ වාර්තාවෙහි මුල් ලේඛන විනාශවීම / පිටපත් නොමැතිවීම.

- රෝහල්වල ඉපදුණු දරුවන් සම්බන්ධයෙන් රෝහල් වාර්තා විනාශවීම / පිටපත් නොමැති වීම.

- උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයේ බලපෑමෙන් ලියාපදිංචි කරන ලද ලේඛන දෙපාර්තමේන්තුව වෙත නොලැබීම / ලේඛන විනාශ වීම.

ඒ අනුව ඉහත පරිදි,

- උපතක් නිසි පරිදි ලියාපදිංචි වී නොමැති,

- 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (24) වන වගන්තිය යටතේ කල් පසු වූ උපතක් ලෙස උපත ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත ලිඛිත සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන,

- නමුත් දෙමාපියන් දෙදෙනාම හෝ එක් අයෙක් ජීවත්ව සිටීම මත ජීව විද්‍යාත්මක සාක්ෂි (ඩී.එන්.ඒ.) මගින් ස්වභාවික දෙමාපියන් සනාථ කර ගත හැකි,

අයගේ ලියාපදිංචි නොවූ උපතක් 1951 අංක 17 දරණ උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ (49) වන වගන්තියේ ප්‍රතිපාදන අනුව යමින් ලබාගනු ලබන "මහේස්ත්‍රාත් අධිකරණ නියෝගයක්" ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක දී ලියාපදිංචි කළ හැකි බව කාරුණික දන්වමි. ඒ අනුව ඉහත ආකාරයේ සිද්ධීන් ඔබ වෙත වාර්තා වන අවස්ථාවන්හි දී, පනතේ (49) වන වගන්තිය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ගොනුකර අධිකරණ නියෝගයක් ලබා ගැනීමට කටයුතු කරන ලෙස අදාළ පාර්ශවකරුවන් දැනුවත් කරන ලෙස මෙයින් දන්වමි.

මෙම චක්‍රලේඛය ලද බව දන්වන්න.

වැ/බ රෙජිස්ට්‍රාර් ජනරාල්

එන්. සී. විතානගේ
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

පිටපත් - 1. නීතිපති - E 393 / 2018 යොමුව අනුව දැන ගැනීම සඳහා

2. ලේකම් - අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - ඔබගේ දැන ගැනීම සඳහා

3. කොමසාරිස්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව - ඔබගේ දැන ගැනීම සඳහා

4. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා

5. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන් - ඔබගේ දැන ගැනීම සඳහා සහ අවශ්‍ය කටයුතු සඳහා

6. සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් - ඔබගේ දැන ගැනීම සඳහා